# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
# உள்நாட்டு இறைவரித் திணைக்களம்
# DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு -2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011-2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකතන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 20135411

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


චක්‍රලේඛ අංකය : SEC / Stamp Duty / 2015 / 03

2015 අප්‍රේල් මස 21 වන දින.

**ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍ය මණ්ඩල ලේකම්, පාර්ලිමේන්තු මහලේකම්,**

**රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන්,පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා අමාත්‍යාංශ ලේකම්වරුන්,**

**රජයේ දෙපාර්තමේන්තු හා ආරක්ෂක හමුදා ප්‍රධානයන්,**

**දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්,**

**පළාත් පාලන ආයතනවල (මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවල) ප්‍රධාන විධායක නිලධාරීන්,**

**ව්‍යවස්ථාපිත ආයතනවල (අධිකාරී, මණ්ඩල, කොමිෂන් සභා, සංස්ථා, රාජ්‍ය බැංකු, විශ්වවිද්‍යාල හා වෙනත් ආයතනවල) ප්‍රධාන විධායක නිලධාරීන් වෙත.**

**<u>මුද්දර ගාස්තු අයකිරීම සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කිරීම හා ප්‍රේෂණය කිරීම සම්බන්ධව උපදෙස් සහ මඟපෙන්වීම්.</u>**

2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙම චක්‍රලේඛය නිකුත් කරමි.

02. එකී මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 1 වන කොටසේ මුද්දර ගාස්තු පැනවීම, නිදහස් කිරීම සහ ඊට අදාළ කරගත යුතු කාර්ය පටිපාටිය සඳහන් කර ඇත. එකී 1 වන කොටසේ 3 සිට 9 දක්වා වගන්ති වල සඳහන් විධිවිධාන සහ එකී පනතේ 03 වන වගන්තිය යටතේ සාදනු ලැබ, පහත සඳහන් අති විශේෂ ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති නියෝග සම්බන්ධව, ඔබගේ දැඩි අවධානය යොමුකර, නියමිත මුද්දර ගාස්තු අය කර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නියමිත පරිදි ප්‍රේෂණය කරන ලෙස, දන්වමි.

(I) 2006.10.05 වන දින හා අංක 1465 / 19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය (අනුප්‍රමාණ)
(II) 2006.10.05 වන දින හා අංක 1465 / 20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය (නිදහස් කිරීම)
(III) 2008.01.01 වන දින හා අංක 1530 / 13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය (අනුප්‍රමාණ සංශෝධන)
(IV) 2012.12.17 වන දින හා අංක 1789 / 09 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය (අනුප්‍රමාණ සංශෝධන)
(V) 2013.05.10 වන දින හා අංක 1809 / 19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය (අනුප්‍රමාණ සංශෝධන)

03. මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාර, මුද්දර ගාස්තු සමථයට පත් කිරීමට බැඳී සිටින සියළුම ආයතන මෙම දෙපාර්තමේන්තුවේ මුද්දර බදු අංශය වෙත ලියාපදිංචි වී, බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය. මේ වනතුරු එසේ ලියාපදිංචි වී නැති සියළුම ආයතන එකී ලියාපදිංචි වීම සඳහා, නියමිත ආකෘති පත්‍ර ලබාගෙන, වහාම අයදුම් කළ යුතුය.

04. මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 7 වන වගන්තියේ සඳහන් මුද්දර ගාස්තු සමථයට පත්කිරීම සම්බන්ධව විධිවිධාන ප්‍රකාර, මුද්දර ගාස්තු සමථයට පත්කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දැනටමත් ලියාපදිංචි වී ඇති ආයතන ප්‍රධානයන් වෙත සෑම වසරකම මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු වලට අදාලව සමථයට පත්කරන ලද මුද්දර ගාස්තු පිළිබඳ ප්‍රකාශය හා ප්‍රේෂණ පත්‍ර ඇතුළු නියමිත ලේඛන එවනු ලැබේ.

05. අදාළ නීති හා නියෝග ප්‍රකාර එක් එක් කාර්තුව තුල විශේෂයෙන් බලපත්‍ර, වැටුප් ලදුපත් හා වෙනත් ලදුපත් සම්බන්ධව, අය කරන ලද මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමේදී, මාසිකව, ඔබගේ ආයතනයේ විවිධ අංශවලින් වෙන වෙනම චෙක්පතක් / චෙක්පත් කීපයක් එවීමෙන් විවිධ ගැටළු උද්ගත වන බැවින් හා අනවශ්‍ය ලෙස හානි හා පාඩු සිදුවන බැවින්, එසේ කිරීමෙන් වැලකී සිටින ලෙස, දන්වමි. තවද එක් එක් නියමිත කාර්තුව තුල සමථයට පත් කරන ලද මුද්දර ගාස්තු පිළිබඳ ප්‍රකාශයේ, නියමිත කාර්තුව තුල විශේෂයෙන් බලපත්‍ර, වැටුප් ලදුපත් හා වෙනත් ලදුපත් සම්බන්ධව අය කරන ලද මුළු මුද්දර ගාස්තු සඳහන් කරන ලෙසත්, එක් එක් කාර්තුව තුළ අයකර ගන්නා ලද මුද්දර ගාස්තු ප්‍රමාණය කාර්තුව අවසන් වී දින 15ක් (පහළොවක්) ඇතුළත මුද්දර ගාස්තු ප්‍රේෂණ පත්‍රයේ පසු පිටෙ සඳහන් උපදෙස් අනුගමනය කරමින්, එක් එක් බැංකුවේ චෙක්පත් වෙන වෙනම ප්‍රේෂණ පත්‍රවල (එනම් ලංකා බැංකුවේ චෙක්පත් එක් ප්‍රේෂණ පත්‍රයකද, මහජන බැංකුවේ චෙක්පත් තවත් ප්‍රේෂණ පත්‍රයකද, ආදි වශයෙන්) සඳහන් කර, එකී ප්‍රේෂණ පත්‍රය/ප්‍රේෂණ පත්‍ර ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට ඉදිරිපත් කර, ලංකා බැංකුවේ අංක : **4153842** දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ මුද්දර ගාස්තු ගිණුමට බැර කරන ලෙසත්, එකී ප්‍රේෂණ පත්‍රයේ/පත්‍රවල 3 වන පිටපත/පිටපත් සමථයට පත් කරන ලද මුද්දර ගාස්තු ප්‍රකාශයට අමුණා මුද්දර බදු අංශයේ කොමසාරිස් වෙත එවන ලෙසත්, දන්වමි. එකී ක්‍රියාමාර්ගය දිගටම අනුගමනය කරන ලෙස හා එකී කරුණු සම්බන්ධව ඔබගේ ආයතනයේ මූල්‍ය / ගිණුම් අංශ ප්‍රධානයන් ඇතුළු අදාළ නිලධාරීන්ගේ විශේෂ අවධානය යොමු කරවන ලෙස, වැඩිදුරටත් දන්වා සිටිමි.

06. මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ **8** වන වගන්තියට අනුකූලව, 7 වන වගන්තිය ප්‍රකාර ආකාරයට මුද්දර ගාස්තු සමථයකට පත්කර නොමැති අවස්ථාවක හැර, සාධන පත්‍රය ලියා අත්සන් කරන අවස්ථාවේදී නියමිත වටිනාකමින් යුත් ඇලවෙන මුද්දර ගැසීම මගින් මුද්දර ගාස්තු ගෙවනු ලැබිය හැකිය. එක් එක් කාර්තුව තුළ එසේ ඇලවෙන මුද්දර ගැසීම මගින් ගෙවනු ලැබූ මුද්දර ගාස්තු ප්‍රමාණය නියමිත කාර්තුව අවසන් වී දින 15 ක් (පහළොවක්) ඇතුළත මුද්දර බදු අංශයේ කොමසාරිස් වෙත ලිපියකින් වාර්තා කරන ලෙස, ඉතා කාරුණිකව ඉල්ලමි.

07. තවදුරටත් අවශ්‍ය පැහැදිලි කර ගැනීම් සඳහා පහත සඳහන් නිලධාරීන් අමතන ලෙස, ඉතා කාරුණිකව ඉල්ලමි.

කොමසාරිස් - සෘජු දුරකතනය : 011–2135171 ෆැක්ස් : 011-2338577
පොදු දුරකතනය : 011–2135135 දිගුව : 5171
විද්‍යුත් තැපැල් ලිපිනය : dc.stampduty@ird.gov.lk

නියෝජ්‍ය කොමසාරිස් - සෘජු දුරකතනය : 011–2135172
පොදු දුරකතනය : 011–2135135 දිගුව : 5172
විද්‍යුත් තැපැල් ලිපිනය : satharasinghe.dhd@ird.gov.lk

සහකාර කොමසාරිස්වරු -
සෘජු දුරකතන : 011–2135173, 011–2135174, 011–2135175,
011–2135177, 011–2135178, 011–2135179, 011–2135180
පොදු දුරකතනය : 011–2135135 දිගු : 5173, 5174, 5175, 5177, 5178, 5179, 5180

කලයාණි දහනායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

කලයාණි දහනායක
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

<u>පිටපත</u> : විගණකාධිපති - විශේෂ අවධානය පිණිස.